චක්‍රලේඛ අංකය -05/2024

මගේ අංකය -සමු/අධි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප)
ආදිපාද වීදිය,
කොළඹ .01
2024.08. 12

සීමා සහිත කොළඹ දකුණ සමුපකාර සමිතිය හා
බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති වල සභාපතිවරුන් වෙත.

**සභාපතිවරු/උපසභාපතිවරු/අධක්ෂකවරු සමිතිවලින් දීමනා ලබා ගැනීම හා සමිති නියෝජනය කරමින් වෙනත් ආයතනවල ධුර දැරීම.**

1973 සමුපකාර රීති මාලාවේ 17 (ඇ) වගන්තියට අනුව කාරක සභිකයින් තෝරාපත් කිරීම සමිතිය මහා සභාවේ කාර්යක් ලෙස සඳහන් වේ. සමුපකාර සමිති ප්‍රඥප්තියේ 60 (3) (අ) වගන්තියට අනුව වසර 03ක් ඉක්ම යාමට පෙර කාරක සභා නිලවරණය පවත්වා කාරක සභාව තෝරාපත් කර ගත යුතු බවට විධිවිධාන පනවා ඇත. ඒ අනුව සමිතියේ අයිතිකරුවන් විසින් තම සමිතිය කළමණාකරණය කිරීම සඳහා කාරක සභාවක් පත්කර ගත යුතු බවට ඉහත නෛතික විධිවිධානවලින් තහවුරු වේ.

02. එම නෛතික විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතියේ සහ විවිධ සේවා සමුපකාර සමිතිවලට අදාළව නිකුත් කර ඇති 707/14 අංක දරණ 1992.03.27 දිනැති ගැසට් නිවේදනයෙන් සංශෝධිත 297/7 අංක හා 1977.12.28 ගැසට් නිවේදනය අනුව යාවත්කාලීන කරන ලද නාමලේඛණ සෑම කාර්තුවකට වරක්ම පිළියෙළ කර සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීම කාරක සභාව විසින් කලයුතු බවට විධිවිධාන පනවා ඇත. නමුත් එකී නෛතික විධිවිධානවලට අනුව කටයුතු කර නොමැතිවිම මත හෝ යම් හේතුවක් මත නිලවරණය පැවැත්වීමට නොහැකි වුවහොත් ඉහත සඳහන් ප්‍රඥප්තියේ 60 (3) (අ) වගන්තියට පදනම් කර ගනිමින් කාරක සභා නිල කාලය මාස 03කින් දීර්ඝ කරනු ලැබේ.එම කාලය තුළද නිලවරණය පැවැත්වීමට අපොහොසත් වුවහොත් කොමසාරිස් විසින් පාලක මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කලයුතු බව ප්‍රඥප්තියේ නෛතික විධිවිධාන පනවා ඇත.

03. එසේ පත්කරනු ලබන පාලක මණ්ඩල සාමාජිකයින් අතුරු ව්‍යවස්ථානුකූලව අයිතිකරුවන් වන සාමාජිකයන් විසින් පත්කිරීම් සිදු කරනු ලැබු නිලධාරීන් නොවේ. මෙම පත් කිරීම් සිදු කරනු ලබන්නේ ඉතා කඩිනමින් ඉහත සඳහන් අයිතිකරුවන්වන සාමාජිකත්වයට තම සමිතිය කළමණාකරණය කිරීම සඳහා කාරක සභා/ අධක්ෂක මණ්ඩල පත් කර ගැනීමට අවස්ථාව සලසා දීම සඳහා වේ. එසේම ඔවුන් තුළින් සාමාජිකත්වය නියෝජනයවීමක් සිදු නොවේ. එම නිසා පත් කරනු ලබන පාලක මණ්ඩල සාමාජිකත්වයේ අනුදැනුම රහිතව පත්කර ඇත. ඒ අනුව 60 (3) (අ) වගන්තිය හා 48(1)(අ) (II) වගන්තිය යටතේ සහ 48(4) (ආ) වගන්තිය යටතේ පත් කරනු ලබන පාලක මණ්ඩල මෙන්ම 48(3) වගන්තිය යටතේ අධක්ෂක මණ්ඩලයට නම් කරනු ලබන නිලධාරීන්ද ඉහත පරිදි සාමාජිකත්වයේ නියෝජනයක් නොවන නිසා සාමාජිකත්වයේ අනුදැනුම රහිතව පත් කර ඇති නිසාත් ඔවුන්ට සමිතියේ අතුරු ව්‍යවස්ථා කාරක නියෝග හා කාරක රීති හා චක්‍ර ලේඛ අනුව හිමි දීමනා , දිරිදීමනා හෝ වෙනත් දීමනා ලබා ගැනීමට අවකාශ නොමැති බව කාරුණිකව දන්වමි. එසේ වුවද ඔවුන් පාලක මණ්ඩල/ අධක්ෂක මණ්ඩල සාමාජිකයන් ලෙස කරනු ලබන කාර්ය සැලකිල්ලට ගෙන 02/2024 අංක හා 2024.05.20 දිනැති චක්‍ර ලේඛය මගින් ලබා දී ඇති දීමනා හා 03/2024 අංක හා 2024.05.20 දිනැති චක්‍ර ලේඛය මගින් ලබාදී ඇති දීමනා සහ 2021.06.21 දිනැති 04/2021 චක්‍රලේඛයේ 03.02 වගන්තිය යටතේ ලබා ගත හැකි දීමනාව පමණක් ඔවුන්ට සමිතිවලින් ලබා ගැනීමට අවසර දෙමි.

**04.** සමුපකාර සමිති පද්ධතියක් රට තුළ ක්‍රියාත්මක වන අතර ප්‍රාථමික සමිතිවල සාමාජිකත්වය තුළින් ද්විතීය හා මුදුන් මට්ටමේ සමුපකාර සමිති නිර්මාණය වී ඇත. එසේම සමුපකාර සමිතිවල ආයෝජන විවිධ සංවිධානවල ( සමාගම්, රක්ෂණ ආයතන ආදිය) සිදු කිරීම් තුල ආයෝජන සිදු කරන ලද සමිතිවලට එකී ආයතනවල අධක්ෂ්‍ය මණ්ඩල , පාලක මණ්ඩල, සාමාජිකයන් ලෙස මෙන්ම සභාපතිවරුන් ලෙස කටයුතු කිරීමට අවස්ථාව සැලසී ඇත. මෙම නියෝජන අවස්ථාව හිමිවන්නේ සමිතියට වන අතර පුද්ගලයන්ට නොවේ.තවද සමිතිය නිර්මාණය වූයේ සාමාජිකයන් තුළින් වන බැවින් එම අවස්ථාව සාමාජිකත්වය නියෝජනය නොකරන අයෙකු භාවිතා කිරීම සාධාරණ හා යුක්ති සහගත නොවේ. මන්ද ඔවුන් කොමසාරිස් පත්කිරීම් මත ක්‍රියාත්මක වන අතර සාමාජිකයන්ගේ නියෝජිතයන් නොවේ. එබදු අවස්ථාවක සාමාජිකත්වය නියෝජනය නෙකෙරන අයෙකුගේ ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස සාමාජිකත්වයට අගතියක් සිදු වීමටද අවකාශය ඇත. එබදු අවස්ථාවක ඔවුන්ට සාමාජිකත්වයට සෘජු වගකීමක්ද නැත. මෙම පත් කිරීම් සිදු කරනු ලබන්නේ කෙටි කාලීනව සමිතිය පවත්වාගෙන යාම සඳහා පමණක් බව වැඩිදුරටත් අවධාරණය කරමි.

**05.** එම නිසා යම් සමිතියකට සමුපකාර සමිති ප්‍රඥප්තියේ **48 (4)**(අ) වගන්තිය යටතේ හැර මා විසින් පත් කරනු ලබන පාලක මණ්ඩල සාමාජිකයෙකුට එකී සමිතිය නියෝජනය කරමින් තවත් සමිතියක, ආයතනයක, අධක්ෂකවරයෙක් / පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙස හෝ සභාපතිවයෙකු ලෙස කටයුතු කිරීමට අවකාශ නොමැත. ඔවුන් අදාළ ද්විතිය හෝ මුදුන් මට්ටමේ සමිතියේ , ආයතනයේ මහාසභාවක් පවතින්නේ නම් එකී මහා සභාව නියෝජනය කිරීම සඳහා පමණක් අවස්ථාව හිමිවිය යුතුය.

**06.** මෙම චක්‍ර ලේඛණයේ විධිවිධාන ක්‍රියාත්මක වීම අනුව යම් කිසි ද්විතීය සමිතියක අධක්ෂක මණ්ඩල රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය අවම සංඛ්‍යාව හෙවත් සනපූර්ණය රහිතවන පරිදි මහා සභාවෙන් පත්වූ අධක්ෂකවරු සීමාවන අවස්ථාවක ඒ අනුව අධක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නොහැකිවීමෙන් සමිතිය යම් අපහසුතාවකට පත්වන්නේ නම් ඒ සම්බන්ධව අදාළ සමිතියේ ලේකම් විසින් වහාම මා දැනුවත් කිරීමට පියවර ගත යුතුය.

**07.** මාගේ පත්කිරීම් මත යම් සමිතියක පාලක මණ්ඩලය සාමාජිකයෙකු ලෙස කටයුතු කරන අයෙකු යම් ද්විතික සමිතියක මුදුන් මට්ටමේ සමිතියක හෝ වෙනත් ආයතනයක අධක්ෂක මණ්ඩල සාමාජිකයෙකු සභාපතිවරයෙකු වශයෙන් කටයුතු කිරීම ඒ ඒ සමිතියේ ආයතනයේ නීතිරීති වලට අනුව සීමා විය යුතු වුවද ඔවුන් පාලක මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් කටයුතු කරනු ලබන සමිතියේ නියොජිතයෙකු වශයෙන් කටයුතු කිරීම (මහා සභා නියෝජිතයින් හැර) මෙම චක්‍ර ලේඛණය නිකුත් කරනු ලබන දින සිට නතරවූවාසේ සලකා කටයුතු කල යුතුය. එසේම මෙම චක්‍ර ලේඛණය උල්ලංඝනය කරමින් යම් පාලක මණ්ඩල සාමාජිකයෙකු කටයුතු කරන්නේ නම් ඔවුන්ව අදාළ ධූරයෙන් ඉවත් කිරීමට සිදුවන බවත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ **47** වගන්තිය යටතේ කටයුතු කිරීමට සිදුවන බවත් මෙම චක්‍ර ලේඛණය උල්ලංඝනය කරමින් කටයුතු කිරීම තුළ සමුපකාර රීති මාලාවේ **26** වගන්තිය අනුව සමිතියකට සිදුවන අලාභයක්, පාඩුවක් හෝ සමිතිය යටත්වන දඩුවමකට අදාළ පාලක මණ්ඩල සාමාජිකයා තනි තනිව හා සාමූහිකව වගකීමට බැඳෙන බව දන්වමි.

එම්.ඒ.පි. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත.

පිටපත්

| | |
|---|---|
| **01.**ලේකම්-සමුපකාර හා ප්‍රවාහන අමාත්‍යාංශය (බස්නාහිර පළාත) | - කරු.දැ.පි. |
| **02.**සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ/කළුතර/ගම්පහ) | -කරු.දැ.පි.හා නිලධාරින් මගින් පෙන්වීම සඳහා |